# පහාරද සූත්‍ර ධර්ම දේශනය

දේශකයාණන් වහන්සේ

## අති පුජනීය නාඋයනේ අරියධම්ම ස්වාමීන්ද්‍රයන් වහන්සේ


පරිගනක ගතකිරීම

ලලිත් සිරිමෙවන් දිසානායක


2005-02-09

# පෙරවදන

බුදු සසුන මහ සයුරට උපමා කිරීමෙන් පහාරද නම් වූ අසුරේන්ද්‍ර හට දේශනා කළ ඒ අසිරිමත් දෙසුම පහාරද සූත්‍රය නමින්ම හැඳින්වේ. බුදු සසුනේ සිත් අලවා වෙසෙන අප්‍රමාදව සසුන් පිළිවෙත් සපුරන නාඋයන ආරණ්‍යය වාසි ප්‍රිය සීලී සබ්‍රහ්මචාරීන් වහන්සේලාගේ කාරුණික ආරාධනාවෙන් පහාරද සූත්‍රය ඇසුරෙන් පැවැත් වූ දම් දෙසුමක් මෙසේ දහම් පොතක් බවට පත්වී ඇත.

නාඋයන ආරණ්‍ය සේනාසනයේ වත්මන් පුනරෝදය සඳහා දිවා රෑ දෙකෙහි සිතට වෙහෙස නොගෙන ඉමහත් උද්යෝගයකින් සහ කැය වීමෙන් පිළිවෙත් සංවිධාන සපුරන සහවාසි සැම දෙනාගේ මෛත්‍රියට කරුණාවට පාත්‍රවන පූජ්‍ය අඟුල්ගමුව අරියනන්ද ස්වාමින් වහන්සේගේ එක් සාලිස් වැනි පුණ්‍යාත්ම ජන්ම දිනය නිමිත්තෙන් ආයුරාරෝග්‍ය සම්පත් පැතුමෙන් මේ දහම් පොත ධර්ම දනය වශයෙන් පිරිනැමෙනුයේ ශාසන ගෞරවයෙනි. නාඋයන ආරණ්‍යයේ ප්‍රතිපත්ති සංවිධානයේ වෙසෙස් තැනක් දරන සංඝ භාරය උසුලන පූජ්‍ය හිනටියන්ගල විමලානන්ද ස්වාමීන් වහන්සේ විසින් , ඉහත සඳහන් දහම් දෙසුම පටිගත කිරීමෙන් සියතින් ලියා පිටපත් කොට මුද්‍රණය සඳහා සකස් කරන ලද්දේ ඉමහත් ආචාර්ය භක්තියෙනි.

පහාරද සූත්‍රාන්ත දේශනා පාලිය සංක්ෂිප්ත වුවත් එහිලා අර්ථ සම්භාරය අති මහත්ය. එහෙත් පැයකට සීමිතව දෙසූ දහමක් බැවින් දේශනා විලාශයෙන්ම දහම් පොත සැකසී ඇත්තේ තේරුම් ගැනීමේ පහසුව පිණිසය. බුදු සසුනේ යථා තත්වය ගිහි පැවිදි සැමට සුවසේ තේරුම් ගැනීමටත් ශ්‍රද්ධාවත්, නුවණත් අවදි කොට ගෙන සසුන් පිළිවෙත් සපුරා භව තරණය කොට අමා මහ නිවන දක්වාම යා ගැනීමට පහාරද සූත්‍රන්ත දේශනය මග පාදන්නේ සිතට ආලෝකය දෙමිනි.

ශ්‍රද්ධා බුද්ධි සම්පන්නව ආගමික පිළිවෙත් පුරමින් නාඋයන ආරණ්‍යයේ ගරු සඟ පිරිසටත් සෙනසුනටත් ඉමහත් ගෞරවයෙන් ආරක්ෂාවත් අභිවෘද්ධියත් සඳහා අනුග්‍රහය දක්වන පුණ්‍යාත්මී ට්‍රිලීෂියා ජයසේකර සහ පුණ්‍යාත්මනී ශීලා එදිරිසිංහ මවුවරු දෙදෙනාත් එම දරු පිරිසත් සහයෝගීව මේ දහම් පොත මුද්‍රණය කරවා ධර්ම දානය වශයෙන් පිරිනමනුයේ ශාසනාභිවෘද්ධිය පිණිස පූජ්‍ය අඟුල්ගොමුවේ අරියනන්ද ස්වාමීන් වහන්සේට නීරෝගී සුව දීර්ඝායුෂ පතා ආශිංසනයෙනි.

මේ දානමය පුණ්‍ය සම්භාරය අභාවප්‍රාප්ත පින්වත ජයසේකර, පින්වත් එදිරිසිංහ මහතුන් ප්‍රධාන සියළු ඥාති මිත්‍රාදීන්ට සුගති සැපත් කෙළවර අමා මහ නිවන් සුව පිණිස හේතු වාසනා වේවා. පරිත්‍යාගශීලි එම ජයසේකර

ඒදිරිසිංහ පවුල් දෙකේ සියළු දෙනාට ආයුරෝග්‍ය සැපතත්, ධර්‍මඥාන භාවනා ඥානත් මුදුන්පත් වේවා.

දහම් පොත සංස්කරණය කළ පූජ්‍ය හීනටියන්ගල විමලානන්ද ස්වාමීන් වහන්සේටත් නිරෝගී සුව, දීර්ඝායුෂත්, සම්‍යක් ප්‍රර්ථනා සියල්ලත් මුදුන් පත් වේවා.

2005 පෙබරවාරි 27 වෙනිදට එක්සාලිස් විය සපිරෙන පූජ්‍ය අඟුල්ගමුවේ අරියනන්ද ස්වාමින් වහන්සේට නිදුක් නිරෝගී සුවපත් භාවයෙන් විංශත් ශතවර්ෂාධික කාලයක් දීර්ඝායුෂ අත්වේවා. එම මව්පිය දෙදෙනා වහන්සේ ප්‍රධාන පවුලේ සැමටත් එසේම ආයුරාරෝග්‍යාදී ශ්‍රී සම්පත් අත්වේවා.

සොභන ලෙස පොත මුද්‍රණය කළ මුද්‍රණාලයාධිපති තුමන් ප්‍රධාන කාර්ය මණ්ඩලයේ සැමටත් මෙය කියවා තේරුම් ගෙන සසුන් ගුණ පිළිවත් සපුරන සැමටත් රත්නත්‍රයානු භාවයෙන් ආයුරාරෝග්‍යාදී ශ්‍රී සම්පත් අත්වේවා.

**"සුඛිනෝවා ඛේමිනෝ හොන්තු**
**සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා"**

මයට මෙතැති,

නාඋයනේ අරියධම්ම ස්ථවිර
නාඋයන ආරණ්‍ය සේනාසනය
පන්සියයගම.

# පහාරද සූත්‍ර ධර්ම දේශනාව

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

**අභිරමන්ති භන්තේ භික්ඛු ඉමස්මිං ධම්ම විනයෙති ? අභිරමන්ති ඛො පහාරද භික්ඛු ඉමස්මිං ධම්ම විනයෙ, කතිපන භන්තේ අච්චරියා අබ්භූතා ධම්මා ඉමස්මිං ධම්ම විනයෙ, කතිපන භන්තෙ අච්චරියා අබ්භූතා ධම්මා ඉමස්මිං ධම්ම විනයෙ යෙ දිසවා දිසවා භික්ඛු අභිරමෙන්ති. ඉමස්මිංධම්ම විනයෙති, අට්ඨ ඛො පහාරද අච්චරියා අබ්භූතා ධම්මා ඉමස්මිං ධම්ම විනයෙ යේ දිස්වා දිස්වා භික්ඛු අභිරමන්ති. ඉමස්මිං ධම්ම විනයති.**

තුන්ලෝකාග්‍ර සම්මා සම්බුදුරජාණන් වහන්සේ පහාරද අසුරේන්ද්‍රයා අමතා වදාළ පහාරද සූත්‍රාන්ත දේශනාවේ මාතෘකාවක් මේ ඉදිරිපත් වුනේ. බුද්ධත්වයෙන් අවුරුදු දොළහක් ගිය තැන පන්සියයක් සහ පිරිස සමඟ වේරඤ්ජා නුවර වේරඤ්ජක බ්‍රහ්මණ තුමාගේ ආරාධනාවෙන් වස් එළඹී සිටි භාග්‍යවතුන් වහන්සේ වෙතයි පහාරද අසුරේන්ද්‍රයා පැමිණියේ ලොවුතුරා බුදුවන දවසේ පටන්ම භාග්‍යවතුන් වහන්සේ දැකීම සඳහා මේ පහාරද අසුරේන්ද්‍රයා නිතර කථාකරමින් සිටියා. අද යනවා, හෙට යනවා, අනිද්ද යනවා ඔහොම කථාකරමින් ඉන්න අතර අවුරුදු දොළොහක්ම ගතවුණා. දෙළොස්වැනි වසරේ තමයි මේ අවස්ථාව ලැබුනේ. අසුර භවනේ වේපත්ති, පහාරද, රාහු, නමින් ප්‍රධාන අසුරේන්ද්‍රයෝ තුන්දෙනෙක් ඉන්නවා. එයින් එක්කෙනෙක් මේ පහාරද අසුර භවනෙහි සිටින අසුරයෝ ඒ ආත්ම භාවයෙහි මාර්ගඵල නොලබන්නන් වෙනවා. ඒ අයට කියනවා අච්ඡන්දික පුද්ගලයෝ කියලා. අසුර භවනෙහි සිටින අසුරයෝ ත්‍රිහේතුක උනත් ඒ ජිවිතයෙහි මගඵල නිවන් ලබන්නේත් නැහැ. උතුරු කුර දිවයින් වාසී මනුෂ්‍යයෝත් ඒ ජිවිතයෙහි මගඵල නිවන් ලබන්නේත් නැහැ. ඒ වගේම වසවර්ති දිව්‍ය ලෝකයෙහි සිටින මාරපාක්ෂික දෙවියන්ද ඒ ජිවිතයෙහි මගඵල නිවන් ලබන්නේත් නැහැ. ඒ අයට කියනවා අච්ඡන්දික අභව්‍ය පුද්ගලයෝ කියලා. හැබැයි මහා පිං ඇති අය යම් හෙයකින් අනාගතයට හේතු සම්පන්න වෙනවා.

එහෙයින් මේ පහාරද අසුරේන්ද්‍රයා දොළොස් වැනි වසරේ තමන්ගේ විශාල අසුර සේනාවක් පිරිවරාගෙන මහා දවාලේ සර්වඥයන් වහන්සේ වැඩ

ඉන්න තැනට ආවා. සර්වඥයන් වහන්සේ වැඩ සිටියේ වේරඤ්ජ නගරයෙන් පිටත, නළේරු පුචිමන්ද කියලා දේවස්ථානයක් තිබුණා. මේ දේවස්ථානය දිර්ඝ කාලයක් නළේරු කියලා යක්ෂයෙකුට පුද පූජා පැවැත් වූ තැනක්, පසු කාලයක බුද්ධ ප්‍රමුඛ සංඝරත්නයට එතැන විහාරස්ථානයක් බවට පත්වුණා. පුචිමන්ද කියන්නේ කොහොඹ ගහනේ, කොහොඹ ගහක් ආශ්‍රිතවයි මේ දේවස්ථානය පිහිටා තිබුනේ. ඒ නිසා නළේරු පුචිමන්ද නමින් හැඳින්වෙනවා.

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ වෙත පැමිණි පහාරද අසුරේන්ද්‍රයා තමන්ගේ සිතේ අසා දැනගතයුතු ප්‍රශ්න රාශියක් දරාගෙන ආවා. බුද්ධ තේජස නිසා මෙතුමා වැද නමස්කාරයෙන් එකත් පසක හිටගත්තා නමුත් කිසිම දෙයක් කියාගත නොහැකිව යටිකුරු හෙලාළු නෙත් ඇතිව බිම බලාගෙන සිටියා. ඉතින් සර්වඥයන් වහන්සේ දන්නවා තමන් වහන්සේ පළමුව කථාකළයුතු මිසක් මේ පහාරද අසුරේන්ද්‍රයා කථා නොකරන බව දන්නවා. ඒ දැනගෙන උන්වහන්සේම ප්‍රශ්ණ ඇසුවා.

**අභිරමන්ති බො පහාරද අසුරා මහා සමුද්දෙ?** මේකයි ඇසූ ප්‍රශ්නය පහාරදය අසුරයෝ මහා සාගරයෙහි සිත් අලවා වාසය කරනවාද? මෙයින් පහාරද අසුරේන්ද්‍රයාට ලොකු අවදිවීමක් වුණා. තමන් නිතර හැසිරෙන යන එන ස්ථානය ගැනම ඇසීම නිසයි. කාට නමුත් කථාවක් දිගටම පවත්වා ගන්න නම් දන්න දෙයක්, එසේමයි කියන්න පිළිතුරු දියයුතු දෙයක් ගැනම අහන්නට ඕනෑ. ඉතින් පහාරද අසුරේන්ද්‍රයා ගෙන් සර්වඥයන් වහන්සේ ඇසුවේ ඔහු දන්න දෙයක් ගැනයි. නිතර හැසිරෙන තැනක් බැවින් මහා සාගරය ගැන සියල්ල ඔහු දන්නවා. ඒ දන්නා තැන ගැන ඇසූ නිසා කිසිම පැටලීමක් නැතිව පිළිතුරු දෙන්න පුළුවනි. එතුමාට ඇතිවෙලා.

**අභිරමන්ති බො පහාරද අසුරා මහා සමුද්දෙ** කියලා ස්වාමීනි එසේය මහා සාගරයෙහි අසුරයෝ සිත් අලවා වාසය කරනවා කියලා පිළිතුරු දුන්නා. ඉතින් කථාව ආරම්භ වුණා. සර්වඥයන් වහන්සේට අවශ්‍ය වුනේ මේ අසුරයන්ට මාගීඵල ලබාදීම නොවෙයි. ඒ අසුරයන්ට අනාගත සුභ සිද්ධිය සඳහා ධර්මාබෝධයක් ලබා දීමයි. අසුරයන්ට එම ජිවිතයෙහි මාර්ගඵල නොලැබෙන බව මැනැවින් දන්නවා එවැනි අවස්ථා වල අනාගත හේතු සම්පත් වනු පිණිස මහත් කරුණාවෙන් ධර්මානුශාසනා පවත්වනවා. දැන් මෙතන විශාල ලක්ෂ සංඛ්‍යාත අසුර පිරිසක් ඉන්නවා.ඒ අයට අනාගත හේතු සම්පත්තිය තියෙනවා. මේ බණ ටික දේශනා කිරීම දැන් ඉතින් පහාරද අසුරෙන්ද්‍රයා ගෙන් සර්වඥයන් නැවත ඇසුවා.

**"කති පන පහාරද මහා සමුද්දේ අච්ඡරියා අබ්භූතා ධම්මා යෙ දිස්වා දිසවා අසුරා මහා සමුද්දේ අභිරමන්ති , පහිරදය"** අසුරයින් යමක්

දැක දැක මහා සාගරයෙහි සිත් අලවා වාසය කරනවා නම්, ඒ මහා සාගරයෙහි අසුරයන්ට සිත් ඇලවීමට හේතු වන ආශ්චර්ය අද්භූත ධර්ම කොපමණ තිබෙනවාද? මේ ප්‍රශ්නය සර්වඥයන් වහන්සේ ඇසුවා. ඒ ගැනත් ඔහුට ලොකු සතුටක් ඇති වුණා. කිසිම තැති ගැනීමක් නැතිව පැටලීමක් නැතිව කෙලින්ම පිළිතුරු දෙන්න එතුමාට පුළුවනි.

"**කති පන පහාරද මහා සමුද්දේද අච්ඡරියා අබ්භූතා ධම්මා යෙ දිස්වා දිස්වා අසුරා මහා සමුද්දෙ අභිරමන්ති, පහාරාදය**" අසුරයින් යමක් දැක දැක මහා සාගරයෙහි සිත් අලවා වාසය කරනවා නම්, ඒ මහා සාගරයෙහි අසුරයන්ට සිත් ඇලවීමට හේතු වන ආශ්චර්ය අද්භූත ධර්ම කොපමණ තිබෙනවාද?මේ ප්‍රශ්නය සර්වඥයන් වහන්සේ ඇසුවා. ඒ ගැනත් ඔහුට ලොකු සතුටක් ඇති වුණා. කිසිම තැති ගැනීමක් නැතිව පැටලීමක් නැතිව කෙලින්ම පිළිතුරු දෙන්න එතුමාට පුළුවනි.

"**අට්ඨ ඛො භන්තෙ මහා සමුද්දෙ අච්ඡරියා අබ්භූතා ධම්මො යෙ දිස්වා දිස්වා අසුරා මහා සමුද්දෙ අභිරමන්ති කථමෙ අට්ඨ?**" ස්වාමීනි, යමෙක් දැක දැක අසුරයෝ මහා සාගරයෙහි සිත් අලවා වාසය කරනවාද? එවැනි මහා සාගරයෙහි සිත් අලවා වාසය කිරීමට හේතුවන ආශ්චර්ය අද්භූත ධර්ම අටක් තිබෙනවා. ඒ මොනවාද?

මේ සාගරය අනුපිළිවලින් ගැඹුරු වී ඇති බව මහා සමුද්‍රයෙහි තියෙන පළමු වැනි තම ආශ්චර්ය අද්භූත කාරණයැයි. මේ දැක දැක අසුරයෝ මහා සමුද්‍රයෙහි බොහොම සිත් අලවා වාසය කරනවා. සතුටින් වාසය කරනවා.

"**පුන ච පරං භන්තෙ මහා සමුද්දො ඨිත ධම්මො වෙලං නාතිවත්තති අයං මහා සමුද්දෙ අච්ඡරියො අබ්භූතො ධම්මො ස්වාමීනි** " මහා සමුද්‍රයෙහි දෙවැනි ආශ්චර්ය අද්භූත ධර්මය නම් මේකයි. මහා සමුද්‍රයෙහි තමා පිහිටා සිටින තැන සිටිනවා විනා වෙරළ පනින්නේ නැහැ. "**වෙලං නාතික්කමති**" වෙරළ නික්ම වන්නේ නැහැ. ගොඩබිමට පැතිරෙන්නේ නැහැ. මහා සාගරයෙහි විශාල රැලි වේගයෙන් පෙරළි පෙරළී ඇවිල්ලා වෙරළෙහි ආපස්සට තල්ලු වෙනවා. මේ මහා සාගරය වෙරළහි නොපැමිණෙන බව මහා සමුද්‍රයෙහ දෙවැනි ආශ්චර්ය අද්භූත ධර්මයැයි. මේක දකිමින් අසුරයෝ මහා සාගරයෙහි සිත් අලවා වාසය කරනවා.

"**පුන ච පරං භන්තෙ මහා සමුද්දො න මතෙන කුණපෙන සද්ධිං වසති**" ඒ කියන්නේ මහා සාගරය පවිත්‍රයි. මහා සාගරයට යම් බඳු පිටතින් කුණපයක් ආවා නම් එසේ නැත්නම් මහා සාගරයේ මිය යන සතෙක් ඇතොත් ඔහුගේ මෘත ශරීරය වහාම ගොඩ බිමට තල්ලු කර දමනවා. එය මහා සාගරයෙහි කිසිම කුණපයක් රැඳී නොසිටින බව මහා සාගරයෙහි තියෙන්.

තුන්වන ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයැයි. මේක දකිමින් අසුරයෝ මහා සාගරයෙහි සිත් අලවා වාසය කරනවා.

එසේම ස්වාමීනී මේ මහා සාගරයට සතර දිගින් නොයෙක් නම් ගොත් ඇති නොයෙක් ගංගාවන් ගලා බසිනවා. දඹදිව තලය මැද්දෙන් ගලන ගංගාවන්ම ගංගා, යමුනා, අචිරවතී, සරභූ, මහී නමින් පඤ්ච මහා ගංගාවන් හා තව නොයෙක් නම්වලින් ගංගා ගලා බසිනවා. ඒ ගලා බසින සියලුම ගංගාවෝ මහා සමුද්‍රයට පතිතවූ වායින් පසුව පළමු නම් ගොත් සියල්ල හැර දමා මහා සමුද්‍රය කියන එකම නමක් බවට පත් වෙනවා. මේක මහා සාගරයෙහි සිව්වැනි ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයැයි. මේක දකිමින් අසුරයෝ මහා සාගරයෙහි සිත් අලවා වාසය කරනවා.

එසේම ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස, මේ මහා සාගරයට කොපමන ගංගා ජලය ගලා ආවත් අහසින් ධාරානිපාත වැසි වැස්සත් මහා සාගරයෙහි ඉඩ මිදිවීමක් නැහැ. උතුරා යාමක් නැහැ. ඒ මහා සාගරයට ඒ තරම්ම ජල ස්කන්ධයක් දරාගෙන සිටිනවා.මේක මහා සාගරයෙහි පස්වැනි ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයැයි. මේක දකිමින් අසුරයෝ මහා සාගරයෙහි සිත් අලවා වාසය කරනවා.

එසේම ස්වාමීනී " **අයං මහා සමුද්දෙ ඒක රසෝ ලවණ රසෝ**" මේ මහා සාගරයෙන් කොතැනින් දිය බිඳුවක් ගත්තත් එහි ඇත්තේ එකම රසයයි. ලුණු රසයයි. වෙන කිසිම රසක් එහි ඇත්තේ නැහැ. එහි ඇත්තේ ලුණු රසය පමණයි. මේක මහා සාගරයෙහි සය වැනි ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයැයි. මේක දකිමින් අසුරයෝ මහා සාගරයෙහි සිත් අලවා වාසය කරනවා.

එසේම ස්වාමීනී මහා සාගරය විශාල ප්‍රමාණයෙහි රන් රුවන් වලට ආකරයක්. ඒ කියන්නේ මුත්තා මණී, වෙළුරියෝ සඛෝසිලා, පවාළං, රජතං, ජාත රූපං, ලොහිතඞ්කෝ, මසාරගල්ලං දසවිධ රත්නයන්ගෙන් පිරිලා තිබෙන මහා සාගර පත්ල මේ මහා පොළවේ තිබෙන රන් රුවන් වලට වඩා විශාල ප්‍රමාණයක් තියෙන්නේ මහා සාගර පත්ලේ ඒ ද සවිධ රත්නයටද මහා සාගරය ආකරයක් වීම මහා සාගරයෙහි සත්වැනි ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයැයි. මේක දකිමින් අසුරයෝ මහා සාගරයෙහි සිත් අලවා වාසය කරනවා.

එසේම ස්වාමීනී, මේ මහා සාගරයෙහි අසුරයෝද නාගයෝද මේ අය යොදුන් සිය ගණන් දිග මහත ඇති මහා භූතයෝ මේ මහා සාගරයෙහි වාසය කරනවා. මත්ස්‍යයන් වශයෙන් තිමී, තිමිඞගල, තිමිරපිඞගල, අජකධාරෝග, ආනන්ද ආදී විශාල මත්ස්‍යයෝ මේ මහා සාගරයෙහි වාසය කරනවා. සමහර මත්ස්‍ය කෙනෙක් යොදුන් සියයක් දිගයි.සමහර මත්ස්‍ය කෙනෙක් යොදුන්

තුන්සියයක් දිගයි. සමහර කෙනෙක් යොදුන් හාරසියයක් දිගයි. සමහර මත්ස්‍යයෝ යොදුන් පන්සියයක් දිගයි. ඒ වගේම අසුරයොත් ඒ විධියට විශාල ශරීර ඇත්තෝ ඉන්නවා. රාහු අසුරේන්ද්‍රයාම යොදුන් අසුහාරදහසක්ම උසයි කියනවා එතරම්ම මහා පුදුම ශරීර ඇති සත්වයෝ මේ මහා සාගරයේ වාසය කරනවා. ඒ මහා ශරීර ඇති මහත් සත්වයන්ට වාසස්ථානයක් වීම මහා සාගරයෙහි අටවන ආශ්චර්ය අද්භූත ධර්මයයි.මෙය දැක දැක අසුරයෝ මහා සාගරයෙහි සිත් අලවා වාසය කරනවා කියා තමා හොඳින් පළපුරුදු තැනක් බැවින් මහ සයුරෙහි තියෙන ආශ්චර්ය අද්භූත කාරණා අට සර්වඥයන් වහන්සේ ඉදිරියෙහි නොබියව නොපැකිලව පහාරද අසුරේන්ද්‍රයා ප්‍රකාශ කලා. ඊළගට තමනුත් ප්‍රශ්නයක් ඇසුවා.

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස "**අපි පන භන්තෙ භික්ඛූ ඉමස්මිං ධම්ම විනයේ අභිරමන්ති ති ?**" භික්ෂූන් වහන්සේ මේ බුදු සසුනෙහි සිත් අලවා වාසය කරනවාද? ස්වාමීනි කියලා ඇසුවා.

**අභිරමන්ති බෝ පහාරද භික්ඛූ ඉමස්මිං ධම්ම විනයේති පහාරදය,** භික්ෂූන් වහන්සේලා මේ බුදු සසුනෙහි සිත් අලවා ගෙනම වාසය කරනවා.

**කති පන භන්තෙ ධම්ම විනයේ අච්ඡරියා අබ්භූතා ධම්මා ස්වාමීනි** මේ බුදු සසුනෙහි ආශ්චර්ය අද්භූත ධර්ම කොපමන තියෙනවාද?

**පහාරදය** මේ බුදු සසුනෙහි ආශ්චර්ය අද්භූත ධර්ම අටක් තියෙනවා. එතැනදී සර්වඥයන් පුළුවන් අටක් නොවෙයි කෝටියක් අසංඛෙයක් උනත් මේ බුද්ධ ශාසනයෙහි තියෙන ආශ්චර්ය දේවල් කියන්න. නමුත් පහාරද අසුරේන්ද්‍රයා ඉදිරිපත් කළ මහා සාගරයෙහි දැක්වෙන ආශ්චර්ය කාරනා අටට සංසන්දනය කරණු පිණිස සියලුම බුද්ධ ගුණයන් පද අටකට එක්කාසු කරලා සම්පිණ්ඩනය කරමින් අටක් පමණක් දේශනා කළා.

පහාරද අසුරේන්ද්‍රය මේ බුද්ධ ශාසනයෙහි ආශ්චර්ය අද්භූත ධර්ම අටක් තියෙනවා කියා ඉදිරිපත් කරමින් එක එක විස්තර කළා.

පහාරදය මේ මහා සාගරය අනු පිළිවෙළින් ගැඹුරු වුවා නේද? අඟලින්, වියතින්, බඹයෙන්, රියනෙන්, ඔය වගේ යෂ්ටියෙන්, ඉස්බයෙන්, ගව්වෙන්, දෙගව්වෙන්, යොදුනෙන් ඔහොම ගිහිල්ලා අසුහාරදහසක් යොදුන් සේ ගැඹුරු වෙලා තියෙනවානේ ඒ වගේ අයං ධම්ම විනයෝ අනු පුබ්බ සික්ඛා,අනු පුබ්බ කිරියා, අනු පුබ්බ පටිපදා, මේ ධම්ම විනය අනු පිළිවෙළින් හික් විය යුතු ශාසනයක්,අනු පිළිවෙළින් ක්‍රියා කළ යුතු ශාසනයක්,අනු පිළිවෙළින් පිළිපැදිය යුතු ශාසනයක් එයින් අනුපුබ්බසික්ඛා කිව්වේ සීලය සීලය සියල්ලෙන් සියල්ල පරිපූර්ණ සීලය පළමුකොට සමාදන් වන්නේ නැහැ. සීලයෙන් මුලින්ම සමාදන්

.

වන්නේ තිසරණයයි. නැවත නිත්‍ය සීලය වශයෙන් ගෘහස්ථ පංචශීලය, ආජීවාෂ්ඨමක සීල, ඒ වගේම උපෝස්ථ වශයෙන් අෂ්ඨාංග සීලයයි නිත්‍ය වශයෙන් දස සීලයයි, ශාසනික වශයෙන් සාමණේර දස සීලයයි, ඊළඟට උපසම්පදා කෝටියක් සංවර සීලයයි මෙම අනුපුබ්බකිරියා ධුතාංග දහතුනක් මෙම බුදු සසුනෙහි තියෙනවා. ඒ ධුතංග ධර්ම ඕමක මධ්‍යම උත්කෘෂ්ඨ වශයෙන් ගතහොත් තිස් නමයක් තියෙනවා.ඒවා අනු පිළිවෙළින් පුරනවා.පළමුවෙන් ඕමක, දෙවනුව මධ්‍යම,තුන්වෙනුව උත්කෘෂ්ඨ මෙහෙම ධුතංග දහතුන අනු පිළිවෙළින් පිරිය යුතු වෙනවා.එයට කියනවා අනු පුබ්බකිරියා අනු පිළිවෙළින් ක්‍රියාකාරීව ධුතංග පුරනවා. අනු පිළිවෙළින් කෙළෙසුන් තුනී කරමින් ලිය ලියා යනවා. අනුපුබ්බ පටිපදා ඒ වගේම සමථ විපස්සනා භාවනා පිළිවෙත් අනු පිළිවෙළින් සපුරනවා.

**"න ආයතකෙනෙ ච අඤ්ඤා පටිවෙධො"** එක වරම රහත් වෙනවා නොවෙයි පළමුව සීල විසුද්ධිය පුරණවා. චතුපාරිසුද්ධි සීලය මැනවින් පුරනවා. ඊළඟට චිත්ත විසුද්ධිය සඳහා උපචාර භාවනා, උපචාර ධ්‍යානය, ඊළඟට රූපාවර ධ්‍යාන, පළවෙනි, දෙවැනි, තුන්වෙනි, හතරවෙනි ධ්‍යාන අරූප සමාපත්ති, සතර ධ්‍යාන, ආනාපාන සති දිවාත්තිංසාකාර සමාධි, ඊළඟට ඕදාත කසිණ සමාපත්ති, බ්‍රහ්මවිහාරී සමාපත්ති, බුද්ධානුස්සති අවිඤ්ඤාණක දස අසුභය මරණානුස්සති, ඊ ලඟට කසිණ දහය ඔය විදිහට උපචාර කර්ම ස්ථාන සහිතව මේ අර්පණා ධ්‍යාන කර්මස්ථාන අනුපිළිවෙළින් වඩනවා. එයින් නොනැවතී දිට්ඨි විසුද්ධිය, කංඛා විතරන විසුද්ධි, මග්ගා මග්ග ඤාණ දස්සන විසුද්ධිය, පටිපදාඤාණ දස්සන විසුද්ධිය, ඤාණ දස්සන විසුද්ධිය කියන මේ පිළිවත් අනුපිළිවෙළින් වඩනවා. ඒ අනුපිළිවෙළින් සමථ විපස්සනා භාවනා වැඩීමෙන් තමයි අඤ්ඤා පටිවේධෝ අර්හත්වය දක්වා ප්‍රතිවේධය ලැබෙන්නේ. ඒ නිසා මහා සාගරය අනු පිළිවෙළින් ගැඹුරු වුවාසේ මේ බුදු සසුන තිසරණයේ පටන් අනු පිළිවෙළින් සීලයෙන්, සමාධියෙන්, ප්‍රඥාවෙන් ගැඹුරු වී සමථ විපස්සනාවෙන් ගැඹුරුවී බෝධි පාක්ෂික ධර්මයන්ගෙන් ගැඹුරු වී ඒ වගේම ධ්‍යාන සමාපත්ති අභිඤ්ඤා වන්ගෙන් ගැඹුරු වී විපස්සනා ඥාණ අනු පිළිවෙළින් ගැඹුරු වී ගොස් සෝවාන් ආදී මාර්ග පිළිවෙලට ගැඹුරු වී ගොස් අර්හත්වයට සාක්ෂාත් වෙනවා. මේක බුද්ධ ශාසනයෙහි තියෙන පළමුවෙනි ආශ්චර්‍ය අද්භූත ධර්මයයි. මෙය දැක දැක මගේ ශ්‍රාවකයෝ බුදු සසුනෙහි සිත් අලවා වාසය කරනවා. පහාරදය මේ මහා සාගරයෙහි විශාල රැලි වේගයෙන් ඇවිත් වෙරළේ හැපී ආපස්සට හැරී යනවා. වෙරළ ඉක්මවන්නේ නැතිව වගේ මේ බුදු සසුනෙත් තියෙනවා දෙවන ආශ්චර්ය අද්භූත ධර්මයක්.

**"යං මම සාවකිනං සික්ඛාපදං පඤ්ඤත්තං තං මම සාවකි ජීවිත හේතුපි නාතික්කමන්ති"** මාගේ ශ්‍රාවකයෝ සීලය නැමැති වෙරළ ඉක්මවා යන්නේ නැහැ. මාගේ ශ්‍රාවකයන්ට යම් ශික්ෂා පදයක් මා පනවා ඇතොත් තමන්ගේ ජීවිත හේතුවෙන් වත් ඒ ශික්ෂා පද බිඳ ගන්නේ නැහැ. මාගේ

ශ්‍රාවකයෝ මේ නිසා සීලය නැමැති වෙරළ පනින්නේ නැති බැවින් මාගේ ශාසනයේ සැම විටම **"ඨිත ධම්මෝ"** හැමදම ඒ එකම තත්වයෙන් පවතිනවා.නැත්නම් උල්ලංඝනය නොවී පවතිනවා. මෙන්න මේක බුදු සසුනේ තියෙන ආශ්චර්යය අද්භූත ධර්ම වලින් දෙවැන්නයි. මේ බුදු සසුනෙහි භික්ෂු භික්ෂුණී උපාසක, උපාසිකා සිව්වණක් පිරිස ම තමන් සමාදන්ව ගන්නා සීලය සික්ෂා පද නොබිඳ ආරක්ෂා කර ගැනීම නැමැති වෙරළ නොපැමිණීමේ මේ ආශ්චර්යය අද්භූත කාරණා නිසා මාගේ ශ්‍රවකායෝ බුදු සසුනෙහි සිත් අලවා වාසය කරනවා.

එසේම පහාරදය මේ ශාසනයෙහි කවදාවත් මෘත ශරීරයක් එක්ක ජීවත් වන්නේ නැහැ. මහා සාගරයට කොපමණ මෘත ශරීර මළකුණු ගලාගෙන ආවත් මහා සාගරය ඇතුලෙහි යම් සත්වයෙක් කළුරිය කලොත් ඔහුගේ ශරීරය වහාම ගොඩබිමට තල්ලු කරනවා.මහා සාගරයේ තබාගන්නේ නැහැ මළකුණක් .ඒ වගේම මාගේ ශාසනයත් පිරිසිදුයි.මාගේ ශාසනයෙහි යම් බඳු දුස්සීල පාප ධර්ම ප්ද්ගලයෝ ඇතොත්**"දුස්සීලා පාප ධමමා සංකසස සමාචාරා අස්සමණා සමණ පටිඤ්ඤා අබ්‍රහ්මචාරී බ්‍රහ්මචාරී,පටිඤ්ඤා අන්තෝ පූති අවස්සුතා කසම්බුජතා"** මේ කියන ලකුණු ඇති පාප ධර්මයෙහි ගැලී සිටින පුද්ගලයන් ඇතොත් ඒ පුද්ගලයන් මහා සංඝයා එකතු වී වහාම සාසනයෙන් නෙරපනු ලබනවා. යම් හෙයකින් අප්‍රසිද්ධව එවැනි ගතිගුණ ඇති කෙනෙක් ඇතොත් ඔහු සංඝයාගෙන් අහසට, පොළව මෙන් දුරස්ථ පුද්ගලයෙක්.ඔහු ගුණධර්මයෙන් දුරස්ථ පුද්ගලයෙක් වෙනවා.ඔහුට සුගතිය වත්, නිවන වත් කිසිසේත් ම ලැබෙන්නේ නැහැ.මෙන්න මේක නිසා බුද්ධ ශාසනයෙහි ඒ මළකුණු වැනි අපිරිසිදු පුද්ගලයන් වාසය නොකරන බව බුද්ධ ශාසනයෙහි තුන්වැනි ආශ්චර්යය අද්භූත ධර්ම කාරණයයි. මෙය දකිමින් මගේ ශ්‍රවකායෝ බුද්ධ ශාසනයෙහි සිත් අලවා වාසය කරනවා.

එසේම පහාරදය මේ සාගරයට වැටෙනවා ගංගා, යමුනා, අචිරවති, සරභූ,මහී නමින් නම් ගොත් ඇති ගංගාවෝ.මහා සාගරයට වැටුනාම පළමු නම් ගොත් සියල්ල හැරදමා එකම වහා සමුද්‍රය කියන නමත් ඇති බවට පත්වෙනවා.එයින් මේ ගංගා යමුනා, අචිරවති, සරභූ,මහී කියන මේ ගංගා පහ ර්ටත් කලින් වෙන් වෙන් නම් ගොත් වලින් පැවතුනා. ජම්බුද්වීපය විශාලත්වයෙන 'යොදුන් දස දහක් වට ප්‍රමානයෙන් යුක්තයි. එයින් යොදුන් 4000 ක්ම සාගරයට යට වෙලයි. යොදුන් 6000 යි ඉතිරිව තියෙන්නේ. ඒ යොදුන් 6000 න් 3000 ක පමණ මනුෂ්‍ය වාසය තියෙනවා.යොදුන් 3000 ක ප්‍රමාණයක් හිමාලය වනාන්තරය පවතිනවා.හිමාලය වනාන්තරය ද යොදුන් 500ය 500ය තරම් උසැති විශාල හිම කූඨ අසූ හාරදහසකින් යුක්ත වෙනවා. ඒ අතරින් ගලාගෙන එන ගංගාවන් ම 500 කට වඩා වැඩියි. ඒ අතරට හිමවත් ප්‍රදේශයෙහි මධ්‍ය භාගයේ තියෙනවා විල් හතක්. අනෝතත්ත විල,කර්ණ මුණ්ඩ විල, රථාකාර විල,කුණාල විල,ඡද්දන්ත විල,මන්දකිණී විල,සිංහ ප්‍රපාත විල කියලා.ඒ විල් හතම වට ප්‍රමාණයෙන් එක හා සමානයි.දිගින් පළලින් යොදුන් පණහ පණහ වෙනවා.වට ප්‍රමාණයෙන් ගත්තොත් යොදුන් 150 ක් වට

ප්‍රමාණයක්.එයින් මේ අනෝතත්ත විල කියන එකෙන් තමයි ආරම්භ වෙන්නේ.මේ පඤ්ච මහා ගංගාවන් ගැලීම අනෝතත්ත විල වටේට තියෙනවා විශාල පර්වත වළළු පහක්. ඒ කියන්නේ සුදර්ශන පර්වතය, අංජන පර්වතය,ගන්ධමාදන පර්වතය,කේලාසකූඨ පර්වතය,චිත්‍රකූඨ පර්වතය, කියලා මේ පර්වත පහ මුලින්ම විශාලයි.අගින් කුඩයි. යොදුන් දෙසීය,දෙසීය තරම් උස ප්‍රමාණයකින් යුක්තයි.හරියට කපුටාගේ තුඩ හා සමානයි, පැවැත්ම පෙනීම හැඩහුරුකම මේ පර්වත පහ මුදුනින් එක්කාසු වෙලා මුහුණට මුහුණ හේත්තු වෙලා මේ පර්වත පහට යටවෙලා වටවෙලා තමයි අනෝතත්ත විල තියෙන්නේ.පර්වත පහක් ඇති බැවින් දෙරටු හතරක් මේ තැන තියෙනවා.කවදාවත් හිරු එලිය වැටෙන්නේ නැහැ.හිරු කෙලින් යනවා.ඒ එක්කම රෑ දවල් දෙකේ දේවානුභාවයෙන් වර්ෂාපතනය වෙනවා. දෙවියන්ට නාගයන්ට ගරුඩ ගාන්ධර්වයන්ට මේක වාසස්ථානයක්.මේ පර්වත පහ එතකොට මේ සුදර්ශණ පර්වතය තනිකර ස්වර්ණ, ඊ ලගට චිත්‍රකූඨ පර්වතය සත් රුවන් ඒ වගේම කේලාස කූඨ පර්වතය තනිකර රිදී අංජන පර්වතය අඳුන් වර්ගයක් ඒ වගේම ගන්ධමාදන පර්වතය මිශ්‍රක පර්වතයක්. එහි ලොවෙහි ඇතිතාක් සුවඳ වර්ග තියෙන පර්වතයක්, ඉතින් මේවාට නිතර වර්ෂාපතනය ඇති බැවින් රෑ දහවල් නිතරම ජලය මේ විලට ගලාගෙන එනවා,විලේ තියෙන ජලය විශාල දෙරටු සතරකින් පිටවෙනවා,නැගෙනහිර දෙරටුව උතුරු වයඹ දකුණ දෙරටු වශයෙන් ඒ දෙරටු හතර ආශ්‍රිතව තමයි එක එක සතුන් විශේෂ වශයෙන් වැඩෙන්නේ, බෝවෙන්නේ.එක දෙරටුවක් තියෙනවා සිංහ මුඛ. ඒ ප්‍රදේශයේ සිංහයෝ ජීවත් වෙනවා.තවත් ප්‍රදේශයක් තියෙනවා දෙරටුවක් ඇතුන් වාසය කරන ඒ ප්‍රදේශයට කියන්නේ හස්ති මුඛ දෙරටුව.තවත් ප්‍රදේශයක් අශ්වයෝ බෝවෙන පැත්තක්.අශ්ව මුඛ දෙරටුව.තවත් ප්‍රදේශයක් වෘෂභයෝ ඒ වෘෂභ මුඛ දෙරටුව. ඉතින් මේ දෙරටු හතරින් විශාල ගං මෝය වලින් ගංගා ගලාගෙන යනවා.මේ ගංගාවල් සතර එකට එකක් කළවම් වෙන්නේ නැතිව හැප්පෙන්නේ නැතිව විල වටේ තුන් වටක් ප්‍රදර්ශනය වන හැටියට ගමන් කරනවා චක්‍රකාරීව. එතකොට මේ චක්‍රකාරයෙන් දක්ෂිණාවත්‍රව ගලන ගංගා අතුරින් නැගෙනහිර දෙරටුවෙන් පිටවූ ජලය නැගෙනහිර මුහුදට ගිහින් වැටෙනවා.උතුරින් පිටවෙන ජලය උතුරු මහා මුහුදට ගිහින් වැටෙනවා.බටහිර දෙරටුවෙන් ගළායන මේ ජලස්කන්ධය බටහිර වෙරළින් මුහුදට වැටෙනවා.දකුණු දෙරටුවෙන් පිටවෙන ජලස්කන්ධය අරවගේ තෙවිටක් විල වටේ ප්‍රදක්ෂිනා කරමින් දකුණු පැත්තට ගලාගෙන ගිහිල්ලා යොදුන් හැටක් ඈතට යනවා ගං තලාවක් උඩින් ඊලගට විශාල පර්වතයක හැපිලා අහසට විසිවෙනවා, අහසට විසිවෙලා සියුම් දුවිලි වගේ ජලය අහසේ ගිහිලලා **තියග්ගල පොකබරණී** කියන තැන පතිත වෙනවා. එතැනින් යොදුන් හැටක් පමණ ඈතට ගිහින් පොළව පලාගෙන උමං ගංගාවක් තුළින් තවත් යොදුන් හැටක් ඈතට යනවා, ඊ ලගට වින්ධ්‍යා කියන පර්වතයක හැපීඑය විදගෙන ඇඟිළි පහක් වගේ පස් පොළකින් මේ ජලය පිටවෙලා තමයි පංච මහා ගංගාවන් බවට පතවුනේ.එයින් මුල් අවස්ථාව අනෝතත්ත විල ඒක පළවෙනි ගෝත්‍රයෙහි නම.ඊළගට දකුණු දෙරටුව ඊලගට අර තුන්වාරයක්

ප්‍රදක්ෂිණා කරගෙන ආ ජලයට කියනවා ආවර්ත ගංගාව කියලා.යොදුන් හැටක් පමණ කළු ගල් තලාව උඩින් ගමන් කල ප්‍රදේශයට කියනවා කාල ගංගිව කියලා.පර්වතය හැපී අහසට විසිවී ගිය ජලයට කියනවා ආකාස ගංගාව කියලා. ඒවා මිහිතලයේ පතිත වන තැනට කියනවා **තියග්ගල පොකබරණී** කියලා.නැවත ඉවුර කපාගෙන ඉන් පලාගෙන යන විදගෙන යන යොදුන් හැටක් ප්‍රමාණයට කියනවා **බහල** ගංගාව කියලා.නැවත පොළව පලාගෙන අර වින්ධ්‍යා පර්වතය හැපීගෙන යන ජලයට කියනවා උමං ගංගාව කියලා. ඊට පස්සේ තමයි **ගංගා,යමුනා,අචිරවතී,සරභූ, මහී** නමින් පහක් බවට පත්වී රට මැද්දෙන් ගලාගෙන ගිහින් මහා සාගරයට වැටෙන්නේ.

ඉතින් මේ පේලි පේලියට ආපු නම් පේලි ඔක්කොම මහා සාගරයට වැටුනාම එකම නමක් බවට පතවුනා.මේක මේ මහා සාගරයේ තිබෙන හතරවැනි ආශ්චර්‍ය අද්භූත කාරණයයි. මේක දකිමින් මහා සාගරටයා් අසුරයෝ සිත් අලවා වාසය කරනවා.මාගේ ශාසනයේදීත් ක්‍ෂත්‍රිය, බ්‍රහ්මණ, වෛශ්‍ය,ශූද්‍ර නමින් නොයෙක් වංශ කුල ගෝත්‍ර ඇත්තෝ ඇවිල්ලා මහණ වෙනවා.මහණ වුනාට පස්සේ මුලින් හැදින්වූ ඒ නම් ගොත් සියල්ල හැරදමා **ශ්‍රමණ ශාක්‍ය පුත්‍ර** කියා උතුම් නමක් ඇති බවට පත්වෙනවා. ඒ කියන්නේ එකම නමක් බවට පත් වෙනවා. **ශ්‍රමණ ශාක්‍ය පුත්‍ර** කියන මේ සම්මතයට පත් වෙනවා.මේ මගේ බුද්ධ ශාසනයෙහි තිබෙන සතරවැනි ආශ්චර්ය අද්භූත ධර්මයයි. මේක දකිමින් මගේ ශාසනයෙහි භික්ෂූන් වහන්සේලා සිත් අලවා වාසය කරනවා.

පහාරදය මහා සාගරයට හාත්පසින් දසදිසාවෙන් ජලය ගලා ආවත් අහසපුරා ධාරානිපාත වැසි වැස්සත් ඉඩ මදි වීමක් නොවන්නා වගේ මේ බුද්ධ ශාසනයද භික්‍ෂු, භික්‍ෂුණී,උපාසක,උපාසිකාවෝ කොපමණ සෝවන් වුනත් සකෘදාගාමී වුනත්,අනාගාමී වුනත්,රහත් වුනත් මේ බුද්ධ ශාසනයෙහි ඉඩ මදිවීමක් නැහැ.ඒ කියන්නේ අසංඛත ධාතුව, නිර්වාණ සාගරය කොච්චරවත් ඉඩ තියෙනවා.අසංඛෙය්‍ය,අපරිමේය පිරිසක් නිවන් දැක්කත් ඉඩමදි වීමක් නැහැ.මේක බුද්ධ ශාසනයෙහි තිබෙන පස්වැනි ආශ්චර්ය අද්භූත කාරනයයි.මේක දකිමින් මගේ ශාසනයෙහි භික්ෂූන් වහන්සේලා සිත් අලවා වාසය කරනවා.

එසේම පහාරදය මේ මහා සාගරයෙහි කොතනකින් හෝ දිය බිදක් ගත්තොත් ඇත්තේ එකම රසය ලුණු රසයයිනේ. ඒ වගේම මේ බුදුසසුනේ විනය පිටකය, සූත්‍රන්ත පිටකය දෙකේ ධම්ස්කන්ධ හතලිස් දෙදහසක්, අභිධම් පිටකයේ ධම්ස්කන්ධ හතලිස් දෙදහසක් මේ තරම් අසූහාරදහසක් ධම්ස්කන්ධ අතුරින් කොතනින් දහම් පදයක් ගත්තත් ඒ දහම් පදයේ තියෙන්නේ එකම රසයයි.**"ඒක රසෝ විමුක්ති රසෝ"** එකම විමුක්ති රසයයැයි පවතින්නේ විමුක්තිය කියන්නේ නිර්වාණ රසයයි. ඉතින් මේ එකම රසයක් ඇතිබව මේ බුදුසසුනේ තිබෙන සයවැනි ආශ්චර්ය අද්භූත කාරනයයි.මේක දකිමින් මගේ ශාසනයෙහි භික්ෂූන් වහන්සේලා සිත් අලවා වාසය කරනවා.

**පිරිසිදු සීලයෙන් සුවදවත් වී උතුම් ඤාණාලෝකයෙන් ආලෝකවත්වී නාමරූප පරිච්ඡේද ඤාණයේ පටන් දස මහා විපස්සනා ඤාණය පහලකර ගැණීමෙන් සියළු ආශාවන් දුර හැර බුදු පසේබුදු මහරහතන් වහන්සේලා පැමිණ වදළා වූ සතර මග පිළිවෙලින් පැමිණෙන්නාවූ අතිශයින් ශාන්ත සීතල වූ අමා මහ නිවන් සුවයෙන් සියළු සත්වයෝ සුවපත් වෙත්වා. "**

මේ කරණීය මෙත්ත සූත්‍රය භාවනාවට නගන්න පුළුවන් ඉතාම සරල ක්‍රමයක්. මෙයින් තමන්ගේ ජීවිතයට ගුණාංග පහළොවක් පළමුවෙන් ඇතුලත් කරගන්නවා. ඊ ලගට සියලු සතුන් වෙත මෛත්‍රී සිත් පවත්වනවා. ඊ ලගට විදශිනාවට හැරෙනවා. මේ පිළිවෙල අනුගමනය කිරීමේදී තමන්ට දැනෙනවා තමන්ගේ සිත මෛත්‍රීයෙන් පිරෙන බව. කොයි තරම් ශාන්ත මෛත්‍රියක් තමන්ගේ සිතේ පහළ වෙනවාද කියන එක තමන්ට වටහාගන්න පුළුවන්.

හරියට කලයකට වතුර පුරවන්නා වගේ , හුලං බෝලයකට හුලං පුරවන්නා වගේ අපේ චිත්ත සන්තාන වල ඉතිරියක් නැතිව මෛත්‍රිය පිරෙන හැටි අපට දකගන්න පුලුවන් වෙනවා.එම නිසා කිසිම අරමුණකදී අපේ සිත ගැටෙන්නේ නැතිව බොහොම ශාන්තව තැන්පත්ව පවත්වන්නට පුලුවන් වෙනවා.

එයින් අප රක්නා ශීලය ඉතාම පිරිසිදු වෙනවා. අපේ සිතේ නීවරණ ඈත් වෙනවා ධ්‍යාන වැඩෙනවා. සිත සමාධිමත් සිතක් බවට පත්වෙනවා. එයින් අප දීර්ඝ සංසාරය කෙටිකරගෙන අමා මහ නිවනට ආසන්න වෙනවා.

ඒ වගේම මේ මෙත්ත සූත්‍රය අනුව භාවනා කරන යෝගාවඡරයාට සැපසේ නින්ද යනවා. සැපසේ අවදි වෙනවා. නපුරු සිහින දකින්නේ නැහැ. දෙවියන්ට ප්‍රිය වෙනවා. මනුෂ්‍යයන්ට ප්‍රිය වෙනවා. දෙවියන්ගේ ආරක්ෂාව ලැබෙනවා. වස විස ගිනි විපත් වළකිනවා. මුහුණේ වර්ණය පැහැපත් වෙනවා. සිත සමාධි ගත වෙනවා. නොමුලාව අවසාන මොහොත ගත කරනවා. මෙයින් ධ්‍යානයක් ලබාගත්තා නම් ඒකාන්තයෙන්ම බඹලොව යනවා. නොඑසේනම් සුගතියට යනවා.

යම් විදිහකට මේ ජිවිතයේ මේ භාවනාව විදර්ශනාවට හැරී පාරමී පිරී තිබුනා නම් සතර මග පල පිළිලෙින් අමා මහ නිවන් සුවය ඒකාන්තයෙන්ම අත්වෙනවා.


මේ විදිහට ලෞකික වුද ලෝකෝත්තර වුද අනේක ආනිශංසයන් ගෙන දීමට හේතුවන ඉතාමත්ම ශ්‍රේෂ්ඨ වූ කරණීය මෙත්ත සූත්‍රය අප තව දුරටත් දවසින් දවස භාවිතා කිරීමෙන් බුදු පසේබුදු මහරහතන් වහන්සේලා නිවී

සැනසි වදල අජරාමර ශාන්ත නිවන් සුවයම ප්‍රර්ථනා කරමු.

" ආකාසට්ඨා ච භුම්මට්ටා - දේවනාගා මහිද්ධිකා
පුඤ්ඤංතං අනුමෝදිත්වා - චිරං රක්ඛන්තු බුද්ධ සාසනං "

ධම් ශ්‍රවනානිංසමය කුසල බලයෙන් සැමට උතුම් වූ නිවන් සුව අත්වේවා.

***සාධු / සාධු // සාධු ///***



පරිගනක ගතකිරීම - ලලිත් සිරිමෙවන් දිසානායක

අංක - 55
කෝවිල්මඩ
උඩදුම්බර

දු ක - 081-5686777, 081-5687066

**2006-02-09**